# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,918 — 1970 අගෝස්තු 7 වැනි සිකුරාද — 1970.8.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 590 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 589 | මිළ පාලන දන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 590 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 590 | විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... ... ... | 595 |
| | | "සුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1970 අංක 227

අංකය: ඞී/වීඑප්/17/ඒ (VI).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්වීතියනය කිරීමක්**

1970 ජූලි මස 15 වැනි දින සිට මාස හතරක කාලසීමාවකට යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවේ පහත නම සඳහන් නිලධාරියාව නිත්‍ය බලසේනාවේ සේවය සඳහා අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ද්වීතියනය කරන ලදී.

තාවකාලික මේජර්. කන්කානි තන්තිරි ඉන්ද්‍රසිරි සෝමපාල ද සිල්වා, ල. ශි. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 ජූලි මස 23 දින,
කොළඹ දීය.

8-89

### 1970 අංක 228

අංකය: ඞී. 23/ආර්ජ්සීඑෆ්/169.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1970 නොවැම්බර් මස 1 වෙනි දින සිට රාජකීය ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගනු ඇත.

ගෲප් කපිතාන් ප්‍රේමරත්න ගුණසිංහ වල්පිට (01010)—පාලන.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 ජූලි මස 24 දින,
කොළඹ දීය.

8-90

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 229**

පා 4/සාමි 3/17, පා 4/සාමි 10/8.

### අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥා පනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. අසුරමුනි ආගිලිස් ද සිල්වා වෛද්‍යරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා ද,
2. යටගම ආරච්චිගේ එමානිස් ද සිල්වා මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා ද,

සාමදාන විනිශ්චයකාරවරුන් වශයෙන් කර ඇති පත්කිරීම් වහාම ක්‍රියාත්මක වන සේ මෙයින් අවලංගු කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 ජූලි මස 29 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-202/2

---

**1970 අංක 230**

පා 4/සාමි 4/31, පා 4/සාමි 20/72.

### අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥා පනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජූසේ මරියා ජයමාන්න වන මම,

1. නීතිඥ හර්බට් මැක්ස්වෙල් ජයවර්ධන මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
2. අප්පුකුට්ටි සුබ්‍රමනියම් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 ජූලි මස 29 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-202/1

---

**1970 අංක 231**

### ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා 4/හමප 22/13.

ජයවීර මුදියන්සේලාගේ ඒකනායක මහතා 1970.7.16 වෙනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ මාරපන ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පත් කර ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-202/3

---

**1970 අංක 232**

අංකය : ඊබී/ඒ-204/3.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මාතර පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත වී. දේවේන්ද්‍ර මහතා, 1970 ජූලි මස 6 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව මාතර පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්, මාතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩීබිඳී ගිය යාත්‍රා භාරගන්නා නිලධාරි, මාතර බන්ධනාගාර අධිකාරි සහ මාතර පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1970 ජූලි මස 22 වන දින.

8-105

---

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

**1970 අංක 233**

පහත සඳහන් පත්කිරීම් ම විසින් නියම කර ඇත :—

රෙජිස්ට්‍රාර් සේවයේ III වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්, සී. එච්. ගුණවර්ධන මහතා 1970 මැයි 15 වැනි දින සිට කොළඹ කාර්යාලයයේ සේවය කරමින් කොළඹ පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන්.

රෙජිස්ට්‍රාර් සේවයේ III වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්, එම්. බී. ද සිල්වා මහතා 1970 ජූනි 1 වැනි දින සිට මාතර කාර්යාලයේ සේවය කරමින් මාතර පාලන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වශයෙන්.

රෙජිස්ට්‍රාර් සේවයේ III වැනි ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර්, ඊ. එස්. සුදුසිංහ මහතා 1970 ජූලි 1 වැනි දින සිට බලපිටිය කාර්යාලයයේ සේවය කරමින් ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වශයෙන්.

රෙ. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1970 ජූලි මස 24 වැනි දින,
කොළඹ 1,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයයේ දී ය.

8-100

---

## ආණ්ඩුවේ නිවේදන

### 1967 අංක 10 දරණ වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා ආඥාපනත

1967 අංක 10 දරණ වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා ආඥාපනතේ 7 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති, ඉඩම්පිටියෙ රාල්ලාගේ පුංචිබණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, 1970 ජූලි මස 8 වැනි දින සිට, සී. එගොඩහේවගේ මහතා වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් මෙයින් පත් කරමි.

මෙම පත්වීම යථෝක්ත පනතේ 7 වැනි වගන්තියේ (4) හා (6) වැනි උප වගන්තිවල විධිවිධානයන්ට යටත්වනවා ඇත.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1970 ජූලි මස 8 වැනි දින,
කොළඹ දීය.

8-129

---

### 1963 අංක 11 දරණ මුදල් පනත

**ජාතික ලොතරැයි ව්‍යවස්ථා**

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 1963 අංක 11 දරණ මුදල් පනතේ 11 (අ) සහ 20 දරණ වගන්තිය යටතේ සම්පාදනය කරනු ලැබ එම පනතේ 20 දරණ වගන්තිය අනුව මුදල් ඇමතිතුමා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ජූලි මස 26 වන දින,
කොළඹ දීය.

## ව්‍යවස්ථා

1970 පෙබරවාරි 5 වැනි දින අංක 14,892 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ජාතික ලොතරැයි මණ්ඩලයේ 1967 (අංක 2) දරණ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. "ජාතික සම්පත" යන නාමය වෙනුවට "මහජන සම්පත" යන නාමය 2 වන ඡේදයේ (2) වන වගන්තියේ සහ 4 වැනි ඡේදයේ (2) වැනි වගන්තියේත් එම ඡේදයේම (i), (ii) සහ (v) යන අතුරු වගන්තිවල ද පළ කරනු ඇත.

1970. 7. 1 වන දින සිට මෙම සංශෝධනය ක්‍රියාත්මක වනු ලැබේ.

8-204

---

## මහනුවර නගර සභාවේ මහජනාධාර කාරක සභාව

141 වන පරිච්ඡේදයේ දරුද නීති ආඥාපනතේ 12 වන ඡේදයේ (2) වන කොටස අනුව, සමාජ සේවා ගරු ඇමතිතුමා විසින් ඉහත සඳහන් කාරක සභාවේ කටයුතු කිරීම සඳහා පහත නම් සඳහන් අයවලුන් 1973 ජූනි 30 වන දිනින් අවසන් වන තුන් අවුරුදු කාල සීමාවට එම කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් පත් කර ඇත :—

(1) එච්. සී. පී. ප්‍රනාන්දු මහතා, 891, පේරාදෙනිය පාර, මහනුවර.

(2) නීතිඥ සිරිල් ජයසුන්දර මහතා, දේව වීදිය, මහනුවර.

(3) නීතිඥ කිත්සිරි සෙනවිරත්න මහතා, දේව වීදිය, මහනුවර.

(4) ඩබ්ලිව්. ඒ. ජයසිංහ මහතා, අනගාරික ධර්මපාල මාවත, මහනුවර.

(5) සෝමසිරි මීපාවල මහතා, 28, ආදශී නිවාස, දෙයියන්නෙවෙල, මහනුවර.

(6) වී. ඒ. සෝමපාල මහතා, 174/6, පේරාදෙනිය පාර, මහනුවර.

වී. බ. වැවේගම,
ස්ථිර ලේකම් වෙනුවට.

සමාජ සේවා අමාත්‍යාංශය,
14, බාන්ස් පෙදෙස,
කොළඹ 7.
1970 ජූලි මස 27 වෙනි දින.

8-87

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩිපාලක සභාවේ සාමාජිකයින් ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි පරිච්ඡේදය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

(1) ශුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේවක සාමාජිකයකුව සිට මියගිය කේ. කුලවීරසිංහම් මහතා වෙනුවට පෙනී සිටීමට ඇම්. සී. ඇම්. ෂාෆි මහතා සහ,

(2) තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේවක සාමාජිකයකුව සිට මියගිය කේ. කුලවීරසිංහම් මහතා වෙනුවට පෙනී සිටීමට ඇන්. ෂන්මුගදාසන් මහතා.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
වැඩ බලන ස්ථිර ලේකම්.

කම්කරු අමාත්‍යාංශය,
1970 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

8-55

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනය

(136 වන අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලද බව වූ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

(1) තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය සහ රබර් වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවල සාමාජික යෙකුව සිට ඉල්ලා අස් වූ ඇස්. කේ. ඩී. ජයමාන්න මහතා වෙනුවට එම පඩිපාලක සභාවල සේව්‍ය නියෝජිත සාමාජික යෙකු වශයෙන් පෙනී සිටීමට ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා,

(2) තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස් වූ කේ. ජේ. රත්වත්තෙ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට ඇෆ්. ඩී. සී. විජේසිංහ මහතා සහ,

(3) රබර් වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස් වූ ඇස්. ජේ. සල්ගාදු මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජික යෙකු වශයෙන් පෙනී සිටීමට ඇෆ්. ඩී. සී. විජේසිංහ මහතා.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
වැඩ බලන ස්ථිර ලේකම්.

කම්කරු අමාත්‍යාංශය,
1970 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

8-56

---

ඇල්.ඩී.—බී. 80/44

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට හෝසියරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාවන් 1970 අගෝස්තු මස 21 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරුද්ධවීමට හේතු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට ඇතුළත් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
හෝසියරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක
සභාවේ සභාපති.

1970 ජූලි මස 26 වැනි දින,
කොළඹ දීය.

## උපලේඛනය

හෝසියරි කර්මාන්තය පිළිබඳ පඩිපාල්ක සභාව විසින් කරන ලදුව, 1966 දෙසැම්බර් 9 වැනි දින අංක 14,725 දරන ගැසට් පත්‍රයේ සහ 1968 ජනවාරි 21 දින අංක 14,785/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙහි උපලේඛනයේ දක්වා ඇති තීරණ, එකී උප ලේඛනය අගට පහත දැක්වෙන අභිනව ඡේදය එකතු කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"වාර්ෂික නිවාඩු දවස් (25 වෙනි වගන්තිය)

1. (මෙහි මින්මතු "සුදුසුකම් ලැබීමේ වර්ෂය" යනුවෙන් හඳුන්වනු ලබන) යම් වර්ෂයක කම්කරුවකු අවිච්ඡින්නව සේවය කරමින් සිට දින 218 කට වඩා එකම සේව්‍යයා යටතේ වැඩ කර තිබේනම් ඔහු 218කට වැඩියෙන් වැඩ කර ඇති දින ගණනේ සෑම දින 4 ක ඒකක යනටම එක නිවාඩු දිනයක් බැගින් ගණන් බැලූවිට එන නිවාඩු දිනය හෝ නිවාඩු දින ගණන, ඊලඟ වර්ෂය තුළ දී ඔහුට දිය යුතුය ;

එසේ වුවද දින 274 කට වැඩියෙන් වැඩ කළ යම් කාලයක් වේනම්, ඒ කාලය වෙනුවෙන් එවැනි යම්කිසි නිවාඩුවක් දීමට සේව්‍යයකු බැඳී නොසිටිය යුතුය.

මේ ඡේදයෙහි "කම්කරුවා වැඩකර ඇති දවස්" යන්නට—

(අ) සැලකිල්ලට භාජනව පවත්නා යම් වර්ෂයක් තුළ (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ සේව්‍යයා විසින් ඒ කම්කරුවාට දෙන ලද සෑම නිවාඩු දිනයක් ;

(ආ) සේව්‍යයාගේ අනුමැතිය ලද කවර හේතුවක් නිසා හෝ වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඇ) සිය රක්ෂාවෙහි යෙදී සිටියදී එයින්ම ඇති වූ අනතුරකින් කම්කරුවා ලැබූ තුවාලයක් හේතුකොටගෙන වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඈ) (139 වැනි අධිකාරය වන) කම්කරු වන්දි ආඥාපනතේ III වැනි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යම් වෘත්තීය රෝගයක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඉ) කම්කරුවාට වැඩ දීමට සේව්‍යයාට නුපුළුවන් වූ සෑම දවසක් ;

(ඊ) දින 30කට වඩා නොපැවති සහ නීති විරෝධී නොවූ වැඩ නැවැත්වීමක් හෝ වැඩෙන් පිටමන් කිරීමක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ;

ඇතුළත් නමුදු 24 වැනි වගන්තිය යටතේ සතිපතා නිවාඩු දිනය වශයෙන් නියම කරන ලද දිනට ඊට ඇතුළත් නොවිය යුතුය.

2. (i) කම්කරුවකුට හිමි නිවාඩු දින ගණන හතකට වැඩි නොවේ නම්, ඒ නිවාඩු දින ගණන ඔහුට දිය යුතු අතර ඔහු විසින් එය පිටපිටම ගත යුතුය.

(ii) කම්කරුවකුට හිමි නිවාඩු දින ගණන හතකට වැඩි වේනම්, එම නිවාඩු දින ගණනින් දින හතක් ඔහුට දිය යුතු අතර ඔහු විසින් ඒවා පිටපිටම ගත යුතුය.

3. 2 වැනි ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, කම්කරුවකුගේ නිවාඩු දිනය හෝ නිවාඩු දින ගණන ඔහුත් ඔහුගේ සේව්‍යයාත් අතර අන්‍යෝන්‍ය වශයෙන් ගිවිස ගන්නා දිනයක හෝ දිනවල දිය යුතුය.

4. එක් එක් නිවාඩු දිනය සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමිකය, සුදුසුකම් ලැබීමේ වර්ෂයේ අවසාන දින 60 ඇතුළත් ඒ කම්කරුවා නියම වශයෙන් වැඩ කළ දින සඳහා ඔහු විසින් උපයන ලද (අතිකාල දීමනා සහ ප්‍රසාද මුදල් හැර) සම්පූර්ණ වේතනය එම දින ගණනින් බෙදූවිට ලැබෙන ඔහුගේ සාමාන්‍ය දෛනික වේතනය විය යුතුය.

5. කම්කරුවකුට ඔහුගේ නිවාඩු දිනය හෝ දිනයන් වෙනුවෙන් ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඒ නිවාඩු දිනයට හෝ දිනවලට පෙර ගෙවිය යුතුය. එහෙත් ඒ නිවාඩු දිනයට හෝ දිනවලට දින හතකට වඩා කලින් නොගෙවිය යුතුය."

8-99

---

අංකය : 543 ඊ/141 ඩී (VII කොටස).

මෙයට ඇතුළත් උපලේඛනයෙහි II වැනි තීරයෙහි නියමිත දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූප I වැනි තීරයෙහි නියමිත එක් එක් තනතුර දරන සෑම තැනැත්තෙකුම ඒ තනතුරට පත්කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇත්තෙකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර සහ එම ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත්ව දන්වනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූනි මස 23 වැනි දින,
කොළඹ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

## උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| පදම් කළ හා නොකළ සම් වැඩිදියුණු කරන නිලධාරි ... ... | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරි ... ... | |
| සැලසුම් කාර්යාල සහකාර ... ... | |
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥ I වැනි සහ II වැනි ශ්‍රේණියේ තනතුරු ... ... | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ—අගය කිරීමේ ශාඛාව (1969.10.1 දින සිට) ... ... ... | කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය |
| පුස්තකාල සහකාර—පරිපාලන අභ්‍යාස අංශය ... ... ... | මහා භාණ්ඩාගාරය |
| ප්‍රවාහන නිලධාරි ... ... ... ... | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| කර්යාල කාර්ය සහායක/සයිකල් ඕඩර්ලි, වත්තේගම පිහිටි අන්ධයින් පුනරුත්ථාපනය කිරීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| මඩු ලිපිකරු (1957.10.1 දින සිට 1969.9.30 දින දක්වා) ... ... ... | රජයේ වැඩ දෙපාර්තමේන්තුව |
| මඩු ලිපිකරු (1969.10.1 දින සිට) ... ... ... | මහා මාර්ග දෙපාර්තමේන්තුව |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාරවරු—කණිෂ්ඨ විශ්ව විද්‍යාල ... ... ... | |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාරවරු—චිත්‍රපටි අංශය ... ... | අධ්‍යාපන අමාත්‍යාංශය |
| සංස්කාරකවරු—කණිෂ්ඨ විශ්ව විද්‍යාල ... ... | |
| ගොවිපල කළමණාකරුවන්—කණිෂ්ඨ විශ්ව විද්‍යාල ... ... | |
| ශිල්ප ප්‍රදර්ශකවරු—කාර්මික අධ්‍යාපන ආයතනයන්හි ... ... | |
| I ශ්‍රේණියේ උපදේශිකා (රසායන විද්‍යා) ලංකා උසස් කාර්මික විද්‍යායතනය (1967.5.20 දින සිට ඇල්. සිවගුරුනාදන් මහත්මිය විසින් දරණ තාක් කල්) ... ... | |
| සංදේශ නිලධාරි, I ශ්‍රේණිය (1967.10.1 දින සිට) ... ... ... | සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව |
| කාර්මික සහකාර (සංරක්ෂණ) ... ... ... | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| පිස්කල් පියුන්වරු (තනතුරු 28—1969.10.1 දින සිට) ... ... ... | පිස්කල් දෙපාර්තමේන්තුව |
| එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අරමුදල් කිරිපිටි ගබඩා භාරකරු ... ... | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| පරිවර්තක (තාවකාලික) ඩබ්ලිව්. එස්. එන්. පී. ප්‍රනාන්දු මහතා විසින් දරණ තෙක් ... | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |

8–60

---

## බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත

(318 වැනි අධිකාරය වන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 6 (1) දරණ වගන්තියේ විධිවිධාන අනුව යථෝක්ත ආඥාපනතේ 5 වැනි වගන්තියෙහි සඳහන් වන උපදේශ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස අධිනීතිඥ වෝල්ටර් විමලචන්ද්‍ර මහතා මෙහි පහත සඳහන් දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ගරු අධිකරණ ඇමතිතුමා විසින් පත් කොට ඇති බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූලි මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8–61

---

## කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ මැද පත්තුවේ ඉඹුල්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් අංක 293 දරණ වතුරුගම ග්‍රාම සේවක කොට්ඨාශය නැගෙනහිර සියනෑ කෝරළේ—නිට්ටඹුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට ඈඳීම

1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට කොළඹ පාලන දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළේ මැද පත්තුවේ ඉඹුල්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට දැනට අයත්ව ඇති අංක 293—වතුරුගම යන ග්‍රාම සේවක කොට්ඨාශය, නැගෙනහිර සියනෑ කෝරළේ—නිට්ටඹුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට ඈඳා ඇති බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම ග්‍රාම සේවක කොට්ඨාශය අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනය සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැන ගැනීම සඳහා මෙයි පහත දක්වමි :—

මහේස්ත්‍රාත් උසාවිය : ගම්පහ.

ගම්බද උසාවිය : මුදුන්ගොඩ.

උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : උඅරුවල් පේරුව?

පළාත් පාලන ආයතනය : උඅරුවල් පේරුව ගම් සභාව.

මැතිවරණ දිස්ත්‍රික්කය : අංක 15, දොම්පෙ.

පොලිස් වසම : කිරිදිවැල.

ශ
බී. මහාදේව,
රාජ්‍ය පරිපීලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ජූලි මස 26 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

8-104

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### පාර්ලිමේන්තු මහා මැතිවරණය, 1970

### අංක 57—බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයෙකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයෙකු වූ ඇල්බට් කාරියවසම් මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද 1970. 6. 28 දින මා වෙත ලැබුණු බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූදා සිට ඉදිරියට ඇති සය මාසය තුළදී රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන් එකී වාර්තාව සහ ප්‍රකාශයන් ද කාර්යාල වේලාවන් තුල ඕනෑම විටකදී ගාල්ලේ මැතිවරණ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකි බැව් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. යූ. සී. කුරුප්පු,
සහකාර තේරීම් භාර නිලධාරීතැනා
අංක 57—බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය.

1970 ජූනි 28 දින,
මැතිවරණ කාර්යාලය, ගාල්ල.

8-86

---

අංකය : සී/අයි. 610.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2.

සහ

සේදවත්ත මිල්ස් ලිමිටඩ්,
ශාන්ත ජෝශප් වීදිය,
කොළඹ 14.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිචෙඡද (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන, කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 3, ක්ලිෆර්ඩ් ඇවනිව් හි අංක 23 එන්. ක්‍රිෂ්ණදාසන් මහතා මෙයින් පත්කරනු ලැබේ.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ජූලි මස 26 වෙනි දින,
කොළඹදීය.

---

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය,
71, මැලේ වීදිය, කොළඹ 2.

සහ

සේදවත්ත මිල්ස් ලිමිටඩ්,
ශාන්ත ජෝශප් වීදිය,
කොළඹ 14.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිදවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම් :

(1) පහත දැක්වෙන සේවකයන්, ඔවුන් විසින් මෝලෙහි ශාඛා සමිතියක් පිහිටුවා ගැනීමට පෙර, නිරතව සිටි වැඩෙහි යෙදවීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද,

ඩබ්ලිව්. ප්‍රේමරත්න මහතා,

ඩී. ජී. පී. දිසානායක මහතා,

ඒ. ඒ. වීරසේන ඩයස් මහතා,

ඇම්. ජී. විජේරත්න මහතා,

කේ. පී. ප්‍රේමරත්න මහතා.

(2) සමිතියේ සාමාජිකයන්ට පදිංචිය සඳහා නිවාස නොසැපයීම යුක්තිසහගතද, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද, යන්නත් වේ.

1970 ජූලි මස 10 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

8-54

---

අංකය : ඩබ්. 105/1265 එච්.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය, 13, කැන්දෙ වීදිය, මහනුවර හා කොළඹ 1, රැජින වීදියේ අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ, අප්කොට්කී ඇල්ටන් වත්තේ අයිතිකරුවන් වන ද ග්‍රේට් වෙස්ටර්න් ටී කොම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක X දරණ කම්කරු විනිශ්චය සභාව වෙත මෙයින් යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ජූලි මස 26 වෙනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ලංකා වතු සේවා සංගමය,
13, කන්දෙ වීදිය,
මහනුවර.

සහ

කොළඹ 1, රජින වීදියේ අංක 45 හි ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ, අප්කොට් හි ඇල්ටන් වත්තේ අයිතිකරුවන් වන ද ග්‍රේට් වෙස්ටර්න් ටී කොම්පැණි ඔෆ් සිලෝන් ලිමිටඩ්,

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතු වී ඇති කරුණ නම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකාර, ඇස්. අරුලන්ඩි මහතා අප්කොට් හි ඇල්ටන් වත්තේ ප්‍රධාන ලිපිකාර තනතුරට උසස් නොකිරීම යුක්ති සහගතද, නොඑසේ නම්, අරුලන්ඩි මහතාට කුමන සහනයන් හිමිද යන්නත් වේ.

1970 ජූනි මස 30 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදි.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

8-57

---

අංකය : ඩබ්. 105/276 (II).

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික අරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර හා ගලහ අම්බලමාන වත්තේ පෙර අයිතිකරුවන් වන, අම්බලමාන ටී එස්ටේට්ස් ලිමිටඩ්, සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ, 45; රජින වීදිය, කොළඹ 1, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති නැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක VIII දරණ කම්කරු විනිශ්චය සභාව වෙත මෙයින් යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්, සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ජූලි මස 26 වෙනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ලංකා වතු සේවා සංගමය,
13, කන්දෙ වීදිය,
මහනුවර.

සහ

ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ,
ගලහ, අම්බලමාන වතුයායේ පෙර අයිතිකරුවන් වන,
ද අම්බලමාන ටී එස්ටේට්ස් ලිමිටඩ්,
45, රජින වීදිය, කොළඹ 1.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ලංකා වතු සේවා සංගමය හා අම්බලමාන ටී එස්ටේට්ස් ලිමිටඩ් අතර පවතින කාර්මික ආරවුල නම්, ගලහ අම්බලමාන වතුයායේ සේවක යන් වූ ලංකා වතු සේවා සංගමයේ සාමාජිකයන් අම්බලමාන ටී එස්ටේට්ස් ලිමිටඩ් විසින් 70.3.31 වන දිනෙන් අවසන් වන එක් මසක කල්දීමෙන් පමණක් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට පහත දැක්වෙන ආකාරයට කුමන සහනයන් හිමිද යන්නත් වේ:—

(i) කලින් දැනුම් නොදීමට හිලව් වශයෙන් වේතනය,

(ii) සේවා කොන්ත්‍රාත්තු අනුව නැතිවූ රැකියාවන් සඳහා වන්දි,

(iii) පසුගිය සේවාවන් සඳහා පාරිතෝෂික දීමනා.

1970 ජූනි මස 30 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදි.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

8-59

---

## සමගි මණ්ඩල පනත

### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උප ලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු නැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශ යන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතැනගේ කායසීලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1970 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජූලි මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි හෙනරත්ගොඩ ගම් ප්‍රදේශය.
2. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මාම්පේ-කැස්බෑව ගම් සභා ප්‍රදේශය.
3. කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි පානදුර පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය.
4. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි කඩුගන්නාව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය.
5. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි මැද පළාත යටිනුවර ගම් ප්‍රදේශය.
6. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි කඳු පළාත යටිනුවර ගම් ප්‍රදේශය.
7. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි නානුඔය ගම් ප්‍රදේශය.
8. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි කඳපොළ ගම් ප්‍රදේශය.
9. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ඌව-පරණගම ගම් ප්‍රදේශය.
10. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි යටි පළාත ගම් ප්‍රදේශය.
11. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි වැලිමඩ සුළු නගර සභා ප්‍රදේශය.
12. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි කැප්පෙටිපොල ගම් ප්‍රදේශය.
13. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි උතුරු කලාගම් කෝරළය ගම් ප්‍රදේශය.
14. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කුරුවිටි කෝරළය මැද පත්තු ගම් ප්‍රදේශය.
15. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කුරුවිට කෝරළය පල්ලේ පත්තු ගම් ප්‍රදේශය.
16. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මඩහපොල ගම් ප්‍රදේශය.
17. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පරගොඩ ගම් ප්‍රදේශය.
18. මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි බෙරලපනාතර ගම් ප්‍රදේශය.
19. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටි කුරුන්චකර්නි ගම් ප්‍රදේශය.
20. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි වඳුරඹ ගම් ප්‍රදේශය.
21. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි බද්දේගම ගම් ප්‍රදේශය.
22. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි තෙලිකඩ-මාජුවන ගම් ප්‍රදේශය.
23. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි කොට්ටව ගම් ප්‍රදේශය.
24. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පොල්පාගොඩ ගම් ප්‍රදේශය.

8-231

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ගවයන් හංවඩු ගැසීම

### ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවෙලි ප්‍රා. ආ. නි. කොට්ඨාශය

1958 අංක 29 දරණ සත්ව පණත යටතේ පණවන ලද 1962.11.29 වැනි දින ලංකාණ්ඩුවේ අංක 13,406 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ රෙගුලාසි වල II වැනි කොටසේ 12 (iii) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවෙලි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ 1969/70 වර්ෂයේ ගවයන් හංවඩු ගැසීමේ වැඩ පිළිවෙල මෙහි පහත පල කරමි.

1970 ජූලි මස 23 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේදිය.

ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

| ග්‍රා. සේ. කොට්ඨාශය අංක | ග්‍රා. සේ. කො. නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| එස්. 241 | ... නිලාවෙලි | ... මාරියම්මාන් දේවාලය—නිලාවෙලි ... | ... 70.8.15 සිට 70.8.19 දක්වා |
| එම | ... එම | ... ජී. සිවසම්බුගේ ඉඩම—නිලාවෙලි ... | ... 70.8.20 සිට 70.8.24 දක්වා |
| එම | ... එම | ... එම්. කාසිපිල්ලෙල්ගේ ඉඩම, කොට්ඨාශ 2, නිලාවෙලි | ... 70.8.25 සිට 70.8.29 දක්වා |
| එම | ... එම | ... පසුපති නාගරාජාගේ හරක්ගාල—නිලාවෙලි ... | ... 70.8.30, 70.9.3 |
| එම | ... එම | ... ජේ. එම්. සෙරිප්ගේ ඉඩම, කොට්ඨාශ 1—නිලාවෙලි | ... 70.9.4, 70.9.8 |
| එම | ... එම | ... එම්. තහීර් මීරමොහිදීන්ගේ ඉඩම—කොට්ඨාශ 1 | ... 70.9.9, 70.9.13 |
| එම | ... එම | ... එස්. නල්ලතම්බිගේ ඉඩම, ගෝපාලපුරම්—නිලාවෙලි | ... 70.9.14, 70.9.18 |
| එම | ... එම | ... වාලෙයියුතු කොට්ටම් ඉරක්කන්ඩි ... | ... 70.9.19, 70.9.23 |
| එස්. 240 | ... කුඹුරුපිඩි | ... ග්‍රා. සේ. කාර්යාලය, කුඹුරුපිඩි ... | ... 70.8.15 සිට 70.8.19 දක්වා |
| එම | ... එම | ... පිල්ලෙයාර් දෙවාලය, කුඹුරුපිඩි ... | ... 70.8.20 සිට 70.8.24 දක්වා |
| එම | ... එම | ... ආර්. සී. පල්ලිය, කුඹුරුපිඩි ... | ... 70.8.25 සිට 70.8.29 දක්වා |
| එම | ... එම | ... සම්බාරවැව, කුඹුරුපිඩි ... ... | ... 70.8.30 සිට 70.9.3 දක්වා |
| එම | ... එම | ... මඩුව වැව, කුඹුරුපිඩි ... ... | ... 70.9.4 සිට 70.9.8 දක්වා |
| එම | ... එම | ... පත්තිනිඅම්මාන් දේවාලය ... | ... 70.9.9 සිට 70.9.13 දක්වා |
| එස් 239 | ... කුච්චවෙලි | ... ඉරනකේනිකරාච්චි—කුච්චවෙලි ... | ... 70.9.14 සිට 70.9.18 දක්වා |
| එම | ... එම | ... කොට්ඨාශ 4 කරාච්චි, කුච්චවෙලි ... | ... 70.9.19 සිට 70.9.23 දක්වා |
| එස්. 237 | ... තිරියාය | ... ගම්සභා කාර්යාලය ඉදිරියෙන් තිබෙන ඉඩම | ... 70.8.15 සිට 70.8.19 දක්වා |
| එම | ... එම | ... කරාච්චිවෙලිපට්ටි—තිරියාය ... | ... 70.8.20 සිට 70.8.24 දක්වා |
| එම | ... එම | ... කරයාවලි පට්ටි ... ... | ... 70.8.25 සිට 70.8.29 දක්වා |
| එස් 236 | ... පුල්මුඩෙ | ... වෙත්තිලකේනිතරාච්චි—පුල්මුඩෙ ... | ... 70.8.15, 70.8.19 |
| එම | ... එම | ... මුත්තන්වම්කුලම්—පුල්මුඩෙ ... | ... 70.8.20, 70.8.24 |
| එම | ... එම | ... ඉ. මන්තන්කුලම් පට්ටි, පුල්මුඩෙ ... | ... 70.8.25, 70.8.29 |
| එම | ... එම | ... කොකුලෙයිපාර, කරාච්චි, පුල්මුඩෙ ... | ... 70.8.30, 70.9.3 |
| එස් 234 | ... තෙන්නමරවාඩි | ... ග්‍රා. සේ. කාර්යාලය, තෙන්නමරවාඩි | ... 70.8.15 |
| එස් 236ඒ | ... පරණ මැදවච්චිය | ... විජයරත්න මහතාගේ සාප්පුව ඉදිරිපිට ... | ... 70.8.15 |

8–46

---

## සමුපකාර සමිති පිළිබඳ ආඥාපනත (124 වෙනි අධිකාරය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව, සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52 (2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| 1. සීමාරහිත මිනිපෙ සමුපකාර ණය දෙන සමිතිය | 70.3.23 |
| 2. තල්වාපාඩු සෙන්ට් මවුන්ට් කාමෙල් කොන්වන්ට් විමෙන්ස් පොල්ට්රි කෝපරේටිව් සොසයිටි ලිමිටඩ් ... ... | 70.3.25 |
| 3. කුච්චාවේලි හයිතායතල් කෝපරේටිව් බෙටලිවින් සොසයිටි ලිමිටඩ් ... | 70.4.18 |
| 4. පෙරියා නාවක්කුලම් කෝපරේටිව් ස්ටෝර්ස් සොසයිටි ලිමිටඩ් ... | 70.6.3 |
| 5. සීමාසහිත සොරුවිල් මිල්ලාන පුදුවිල් තරුණ ගොවීන්ගේ සමුපකාර ගොවි කාර්මික සමිතිය ... ... | 70.6.5 |
| 6. සීමාසහිත කියාඹුව නැගෙනහිර කිරිපට්ටි සමුපකාර සමිතිය ... ... | 70.6.10 |
| 7. සීමාසහිත ඉලුක්පිටිය සමුපකාර කඩ සමිතිය | 70.6.10 |
| 8 සීමාසහිත වලලියැද්ද කොස්පැලවත්ත විවිධ සේවා සමුපකාර සමිතිය ... | 70.6.13 |
| 9. සීමාසහිත පිටිපන වීදිය සාන්ත පීතෘ මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමතිය ... ... | 70.6.15 |
| 10. සීමාසහිත සියඹලාපිටිය ගාමිණී සමුපකාර කඩ සමිතිය ... | 70.6.15 |
| 11 සීමාසහිත පොලොන්නරුව දේශප්‍රේමී තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... ... | 70.6.15 |
| 12. සීමාසහිත පිටිපන ශාන්ත සෙබස්තියන් මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.16 |
| 13. සීමාසහිත පිටිපන ගාමිණී මසුන් නිපදවන්නන්ගේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.16 |
| 14. සීමාසහිත සාන්ත ජෝන් ඔෆ් ආර්ක් මසුන් නිපදවන්නන්ගේ සහ අලෙවි කරන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | 70.6.16 |

| සමිතියේ නම | විසා දමන ලද දිනය |
| --- | --- |
| 15. සීමාසහිත අළුත්කුරුව ශාන්ත ජුසේ මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.16 |
| 16. සීමාසහිත පිටිපන වීදිය මඩුකුමාරි මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.16 |
| 17. සීමාසහිත බෝගස්කුඹුර කුළගන සකසුරුවම් කම හා මුදල් ඉතිරි කිරීම පිළිබඳ සමුප කාර සමිතිය ... ... | 70.6.20 |
| 18. සීමාසහිත හෙන්ඩියගල විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 70.6.20 |
| 19. සීමාසහිත තලාහේන පාතිමා මසුන් නිපද වීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය | 70.6.25 |
| 20. සීමාසහිත පිටිපන ශාන්ත ක්‍රිස්ටෝපර් මසුන් නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.25 |
| 21. සීමාසහිත දකුණු පිටිපන පාතිමා මසුන් නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.6.25 |
| 22. සීමාසහිත පිටිපන අනුර මසුන් නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... | 70.6.25 |
| 23. සීමාරහිත හම්බේගමුව සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 70.6.25 |
| 24. සීමාසහිත දෙටගමුව ගොවි ජනපදයේ විවිධ සේවා සමුපකාර සමිතිය ... | 70.6.25 |
| 25. සීමාසහිත පිලෝන් වතුයාය විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 70.6.25 |
| 26. සීමාසහිත හාල්පොල සමුපකාර වෙළඳ සැල් සමිතිය ... ... | 70.6.29 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ
සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්.

1970 ජූලි 27 වෙනි දින,
කොළඹ,
සමුපකාර දෙපාර්තමේන්තුවේදීය.

8–52

---

මගේ අංකය : නීති/ණ/172.

**ජාතික නිවාස දෙපාර්තමේන්තුව**

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥා පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත් යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥා පනතේ අංක 9 (1) බී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන ධනපාල සිරිසේන වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහාත් වෙනුවෙනුත් ක්‍රියා කරමින් අවිස්සා වෙල්ලේ, පී. ජී. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද, 1956.6.24 දින අංක 55 දරණ උකස්කරය යටතේ සහ 1958.8.31 දින පී. ජී ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 104 දරණ අතිරේක ඔප්පුව යටතේ ද මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, ඩී. වී. අමරසේකර මහතා සහ එස්. එම්. ඩී. ඒ. කාමිනේ මිය. ගෙන් 1968.9.30 දින තෙක් අයවිය යුතු රුපියල් විසිනම දාස් දෙසිය විසිහතරයි ශත විස්ස (රු. 29,224.20) අයකර ගැනීම සඳහාත්, එසේම 1968.9.30 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් විසිදාස් පන්සියය (රු. 20,500) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 1968.9.30 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේ දී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උප ලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා කොළඹ, බෙල්මන්ට් වීදියේ, අංක 33 හි එස් වී. පී. ජයකොඩි ප්‍රසිද්ධ වෙන්දේසි කරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1969 අගෝස්තු 15 දින.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, මැදපත්තුවේ හංවැල්ලේ පිහිටි, උතුරින් කොළඹ අවිස්සාවේල්ල පාරෙන්ද, නැගෙනහිරින් අංක 2 දරණ කැබැල්ලෙන්ද, දකුණින් ප්‍රධාන ගම්සභා පාරෙන් සහ බටහිරින් ජී. මාර්තාහාමි සහ තවත් අය විසින් හිමිකම් කියන දේපොලින්ද මායිම් වූ අක්කර එකයි පර්චස් දශම එකයි හයෙන් පහක (අක්. 1, රූ. 0 පර්. 01 5/6) ප්‍රමාණයෙන් යුත්, බලය ලත් මිනින්දෝරු එච්. එස්. පෙරේරා මහතා විසින් සකසන ලද අංක 109 හා 1947.10.7 දිනැති මානක සැලැස්මේ සඳහන් පල්ලිය වත්ත නොහොත් කෝන්ගහවත්ත නැමැති අංක 1 දරණ බෙදා වෙන් කරන ලද කොටස.

පෙරකී හංවැල්ලේ පිහිටි, උතුරින් සහ ඊසානින් කොළඹ-අවිස්සාවේල්ල ප්‍රධාන පාර, කෝන්ගහවත්ත සහ එලාරිස් විජේගුණවර්ධන විසින් හිමිකම් කියන වලාඹිවිටෙන්ද, නැගෙනහිරින් එස්. ඩී. ජෝකිනු සහ තවත් අය විසින් හිමිකම් කියන දෙල්ගහ වත්තෙන්ද, ගිණිකොනින් අංක 1591 දරණ සැලැස්මේ සඳහන් "එන්" දරණ කැබැල්ලෙන්ද, දකුණින් සහ නිරිතෙන් අංක 1591 දරණ සැලැස්මේ සඳහන් "එන්" සහ "පී" දරණ කැබැලි සහ ගම්සභාපාරෙන් සහ බටහිරින් සහ වයඹින් ජී. මාර්තාහාමි සහ තවත් අය දැන් හිමිකම් කියන දේපොලින්ද මායිම් වූ එච්. එස්. පෙරේරා, බලය ලත් මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 45 දරණ සැලැස්ම අනුව අක්කර 6 පර්චස් එකොළහක (අක්. 6, රූ. 0, පර්. 11) ප්‍රමාණයෙන් යුත් පල්ලියවත්ත සහ කෝන්ගහවත්ත නැමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි ඉහත කී ඉඩම් කොටස.

8–117

---

**මහජන බැංකුව, රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 2**

**1963 අංක 11 දරණ මුදල් පනත**

### 73 වගන්තිය යටතේ දැන්වීමයි

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හැත්පත්, හෙක්ටර් අබේවර්ධන වන මම 1963 අංක 11 දරණ මුදල් පනතේ 73 වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව මහජන බැංකුව වෙත පවරා ගෙන ඇති පහත උප ලේඛනයෙහි සඳහන් පවරා ගැනීමේ නියෝගයෙන් අත්කර ගත් ඕනෑම දේපලක් වෙනුවෙන් අයිතිවාසිකම් කියන සෑම අයෙක්ම 1970 අගෝස්තු 7 වන දින සිට මාසයක් තුළදී, 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ලැබිය යුතු සම්පූර්ණ වන්දිය හෝ වන්දි මුදලේ කොටසක් සඳහා, කොළඹ 2, උද්‍යාන වීදියේ අංක 48 දරණ ස්ථානයේ පිහිටි මහජන බැංකුවේ ඉඩම් බේරුම් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර මාර්ගයෙන් ලිඛිතව ආදේශ කළයුතු බව එකී පනතේ උක්ත වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම ලිඛිත ආදේශපත්, කොළඹ 2, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ලේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තැන වෙත පිටපත් තුනකින් ඉදිරිපත් කළයුතු බව සැලකිය යුතුයි.

එච්. අබේවර්ධන,
සභාපති,
මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය.

1970 ජූලි මස 1 දින,
කොළඹ දීය.

### උපලේඛනය

අංක 14,899/1 සහ 1970. 3. 26 දින දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පැවරුම් නියෝග අංක 20.

8–194

## දැන්වීමයි

තුවක්කු ආඥා පනතේ (182 වැනි ඡේදය) 29 වැනි වගන්තිය යටතේ පහත සඳහන් තුවක්කු 1970 අගෝස්තු 19 වැනි දින පෙරවරු 10 ට බදුල්ල කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

2. මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේදී ඉල්ලුම් කළ හැක්කේ බදුල්ල දිසාපතිගෙන් ලබාගත් වලංගු අවසරපත්‍රයක් ඇති පුද්ගලයන්ට පමණකි.

3. තුවක්කු ආඥා පනතේ 14 වැනි වගන්තිය අනුව සාර්ථකවූ ඉල්ලුම්කරන්නා විසින් අවසරපත්‍ර ඉදිරිපත් කොට මුදල් ගෙවිය යුත්තේ ඔහු මිලයට ගන්නාකු ලෙස ප්‍රකාශ කළ විටය.

4. මෙම නියමයන්ට අනුකූලවූ ක්‍රියා නොකරන කල්හි එවැනි තුවක්කු නැවත වෙන්දේසි කරනු ලැබේ.

ඉහත සඳහන් තුවක්කු ලැයිස්තුව

| | | |
|---|---|---|
| පාවිච්චි කළ හැකි තනි කඳ පතරොම් තුවක්කු | ... | 18 යි |
| පාවිච්චි කළ හැකි කානු දෙකේ පතරොම් තුවක්කු | ... | 5 යි |
| පාවිච්චි කළ හැකි .303 රයිෆල් | ... | 2 යි |
| පාවිච්චි කළ හැකි .22 රයිෆල් | ... | 4 යි |
| පාවිච්චි කළ හැකි එයාර් රයිෆල් | ... | 3 යි |
| | | 32 |

ඩබ්ලිව්. තිලකරත්න.
අතිරේක දිසාපති, බදුල්ල දිස්ත්‍රික්කය,
දිසාපති වෙනුවට.

1970 ජූලි මස 26 වෙනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේ දීය.

8-163

---

## හ/හල්පන්දෙනිය රතනපාල පිරිවෙණ—ඉහළබෙලිගල්ල, බෙලිඅත්ත

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශයේ ඉහළබෙලිගල්ලේ පිහිටා ඇති ඉහත සඳහන් පිරිවෙණ රජයේ ආධාර ලබන පිරිවෙණක් ලෙස 1.1.1968 දින සිට ස්ථිර වශයෙන් ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වමි.

පී. සේනරත්,
මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක.

එන්. එල්. එෆ්. ඩී. කරුණාරත්න.
ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, තංගල්ල.
මගේ අංකය : හ/6/99.
වර්ෂ 1970 ක්වූ ජූලි මස 28 වන දින,
තංගල්ල අධ්‍යාපන කාර්යාලයේදීය.

8-167

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිතු සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සිලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී